(මෙය අයැදුම්පත්‍රය සමඟ නොමිලේ නිකුත් කෙරේ)

# ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
## විදේශයකදී ශ්‍රී ලාංකේය අනන්‍යතාව

SRI LANKA
IMMIGRATION AND EMIGRATION

## ගමන් බලපත් අයැදුම් කරන්නන් සඳහා උපදෙස්
(අයැදුම්පත පිරවීමට පෙර සියලු උපදෙස් හොඳින් කියවන්න)

**(අ) අයැදුම්පත්‍ර K, ආ.වි. 35A සම්පූර්ණ කිරීමට උපදෙස්**

(1) ඔබ ගමන් ලියවිල්ල ලබාගැනීමට බලාපොරොත්තු වන්නේ සාමාන්‍ය සේවය යටතේ ද, එක්දින සේවය යටතේ ද යන්න සඳහන් කරන්න. (අදාළ කොටුව තුළ "✓" සලකුණු කරන්න).

(2) අවශ්‍ය ගමන් ලියවිල්ලේ වර්ගය - (i) සියලුම රටවල් සඳහා (ii) මැද පෙරදිග ඇතුළු නිශ්චිත රටවල් සඳහා (ඉන්දියාව, නේපාලය, බංග්ලාදේශය, පකිස්තානය, මාලදිවයින් සමූහ ආණ්ඩුව, ඉරානය, ඉරාකය, ලෙබනනය, සිරියාව, ජෝර්දානය, සවුදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ඕමානය, ක්වේටය, කටාර්, බහරේන් සහ යේමනය) (iii) හදිසි සහතික (ඉන්දියාව සහ නේපාලය) (iv) හඳුනාගැනීමේ සහතික - සියලුම රටවලට හෝ නිශ්චිත රටකට වලංගු කොට නිකුත් කෙරේ. (අදාළ කොටුව තුළ අවශ්‍ය ගමන් බලපත්‍ර වර්ගයට "✓" සලකුණු කරන්න).

(3) ඔබ ගමන් බලපත්‍රයක් ලබා ඇත්නම් අවසන් වරට ලබාගත් ගමන් ලියවිල්ලේ (ගමන් බලපත්‍ර/හදිසි සහතිකය/හඳුනාගැනීමේ සහතිකය) අංකය සඳහන් කරන්න, මෙරට දී එය නැතිවූයේ නම් පොලිසියට කරන ලද පැමිණිල්ලේ සහතික කරන ලද පිටපතක් හෝ විදේශයක දී නැතිවූයේ නම් මෙරටට පැමිණීම සඳහා භාවිතා කරන ලද තාවකාලික ගමන් ලියවිල්ලේ ඡායාස්ථිති පිටපතක් ද සමඟ ඉදිරිපත් කළ යුතුය. (පළමුවරට අයදුම් කරන්නන්ට මෙය අදාළ නොවේ)

(4) විදේශ රටක සිට මෙරටට පැමිණියේ යන්ත්‍රානුසාරයෙන් කියවිය නොහැකි (NMRP) ගමන් බලපත්‍රයකින් නම් එම ගමන් බලපත්‍රයේ අංකය සඳහන් කරන්න. එම තාවකාලික ගමන් බලපත්‍රය එහි ඡායාස්ථිති පිටපතක් ද සමඟ ඉදිරිපත් කළ යුතුය.

(5) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් නිකුත් කළ ජාතික හැඳුනුම්පතෙහි අංකය සඳහන් කරන්න. වයස අවුරුදු 16 ට වැඩි නම් සෑම තැනැත්තෙක්ම තම ජාතික හැඳුනුම්පත එහි ඡායාස්ථිති පිටපතක්ද සමඟ ඉදිරිපත් කළ යුතුය.

(6) ඔබේ මුල් නම සඳහන් කරන්න (වාසගම/පෙළපත් නම). එක් කොටුවක එක අකුර බැගින් ලියන්න. නම් අතර එක් කොටුවක ඉඩක් තබන්න. *අයැදුම්කාරියක් විවාහයෙන් පසු ඇයගේ ස්වාමි පුරුෂයාගේ නම ඇතුළත් කොට ගමන් බලපත්‍රය අයැදුම් කරන්නේ නම් එම නාමය සඳහන් කරන්න (මෙහිදී විවාහ සහතිකයේ මුල් පිටපත, ඡායාස්ථිති පිටපතක් ද සමඟ ඉදිරිපත් කළ යුතුය).

(7) අංක 06 යටතේ සඳහන් කළ ඔබේ නම/වාසගම හැර ඔබේ ඉතිරි සම්පූර්ණ නම සඳහන් කරන්න.
(උප්පැන්න සහතිකයේ අංක 2 තීරුවේ සඳහන් පරිදි)

(8) ශ්‍රී ලංකාවේ පදිංචි ලිපිනය සඳහන් කරන්න.
(8.1) පදිංචි ලිපිනයට අයත් දිස්ත්‍රික්කය සඳහන් කරන්න.

(9) උපන් දිනය සඳහන් කරන්න. (උප්පැන්න සහතිකයට අනුව)

(10) උප්පැන්න සහතිකයේ අංකය හා දිස්ත්‍රික්කය සඳහන් කරන්න (උප්පැන්න සහතිකයේ මුල් පිටපත ඡායාස්ථිති පිටපතක් සමඟ ඉදිරිපත් කළ යුතුය.)

(11) උපන් ස්ථානය, උප්පැන්න සහතිකයේ දැක්වෙන පරිදි සඳහන් කරන්න.

(12) ස්ත්‍රී/පුරුෂ භාවය (අදාළ කොටුව තුළ "✓" සලකුණු කරන්න).

(13) ඔබේ රැකියාව/වෘත්තිය/තරාතිරම හෝ තනතුර මෙහි සඳහන් කරන්න. වචන අතර එක් කොටුවක ඉඩක් හිස්ව තබන්න. (රැකියාව සනාථ කිරීමට අවශ්‍ය අධ්‍යාපන සහතික/වෘත්තීය සහතික/සේවා සහතික/එම සහතිකවල මුල් පිටපත් ඡායාස්ථිති පිටපතක් ද සමඟ ඉදිරිපත් කළ යුතුය).

(14) ඔබ ශ්‍රී ලංකාවේ ද්විත්ව පුරවැසිභාවය ලබාගෙන ඇත්නම් අදාළ කොටුවේ "✓" සලකුණු කර ද්විත්ව පුරවැසි සහතිකයේ අංකය සඳහන් කරන්න (ශ්‍රී ලංකා ද්විත්ව පුරවැසිභාවය ලබාගෙන ඇත්නම් එම සහතිකයේ මුල් පිටපත එහි ඡායාස්ථිති පිටපතක් ද සමඟ ඉදිරිපත් කළ යුතුය).

(15) ඔබව සම්බන්ධ කළ හැකි ජංගම දුරකථන අංකය සඳහන් කරන්න.

(16) ඔබගේ ඊ-මේල් ලිපිනය සඳහන් කරන්න.

(17) ඔබ පුරවැසිභාවය ලබාගෙන ඇති විදේශ රට සඳහන් කරන්න.

(18) ඔබ විදේශ පුරවැසිභාවය ලබාගෙන ඇති රටෙහි විදේශ ගමන් බලපත්‍ර අංකය සඳහන් කරන්න. (එම ගමන් බලපත්‍රයේ ඡායාස්ථිති පිටපතක් ඉදිරිපත් කළ යුතුය)

(19) අයැදුම් පත්‍රය අවු. 16 ට අඩු දරුවෙකුගේ වන විට එම දරුවාගේ පියාගේ හෝ භාරකරුගේ ජාතික හැඳුනුම්පත් අංකය හෝ විදේශ ගමන් බලපත්‍ර අංකය සහ මවගේ හෝ භාරකරුගේ ජාතික හැඳුනුම්පත් අංකය හෝ විදේශ ගමන් බලපත්‍ර අංකය පිළිවෙලින් සඳහන් කරන්න.

(20) දී ඇති කොටු 2 තුළ ඔබගේ අත්සන ඉරිවල නොගෑවෙන පරිදි තබන්න.

(21) අයැදුම්කරුගේ ප්‍රකාශය කියවා අත්සන් තැබිය යුතුය.

මොබිටෙල් වෙතින් අඩුම රෝමිං ගාස්තු
மொபிடெல் மூலம் ஆகக் குறைந்த ரோமிங் கட்டணங்களை அனுபவித்திடுங்கள்
Enjoy the best rates from Mobitel while you roam across the world
අමතන්න/அழையுங்கள்/Call : 1717
Sri Lanka Telecom Mobitel
මම සමඟයි. සැමදා.

**(ආ) ගමන් බලපත්‍රයක් ලබාගැනීමේ දී අවශ්‍ය ලියවිලි**

(i) අයැදුම්කරුගේ/අයැදුම්කාරියගේ උප්පැන්න සහතිකය/අනුමාන වයස් සහතිකය, මුල් පිටපත එහි ඡායාස්ථිති පිටපතක්ද සමඟ විශේෂ අවස්ථාවලදී උප්පැන්න සහතිකය නොමැති විටක/උප්පැන්න සෙවීම පිළිබඳ හිස් ප්‍රතිඵල ලේඛනය/දරුවකුගේ උප්පැන්න සහතිකයේ මුල් පිටපත සහ එහි ඡායාස්ථිති පිටපතක්ද සමඟ.

(ii) ජාතික හැඳුනුම්පත එහි ඡායාස්ථිති පිටපතක්.

**(*) වැදගත්:**
ගමන් බලපත්‍රය ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන අයැදුම් පත්‍රය, ගමන් බලපත්‍රය නිකුත් කිරීමේදී අයැදුම්කරුට/අයැදුම්කාරියට නැවත ලබාදෙනු ලබන අතර එම අයැදුම්පත්‍රය සහ අමුණා ඇති ලේඛන වසර 10 ක කාලයක් ඉක්ම යන තුරු (ගමන් බලපත්‍රය වලංගු කාලසීමාව ඉක්ම යන තුරු) ඉතා සුරක්ෂිතව අයැදුම්කරු/අයැදුම්කාරිය විසින් තබාගත යුතුය.

**(ඇ) අවුරුදු 16 ට අඩු දරුවන් සඳහා ගමන් බලපත්‍රයක් ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන සහ අවශ්‍යතා:**
(වයස අවුරුදු 16ට අඩු ළමුන් දෙමව්පියන්ගේ ගමන් බලපත්‍රවලට ඇතුළත් නොකරන අතර ඔවුන් සඳහා වෙනම ගමන් බලපත්‍රයක් ලබාගැනීම අනිවාර්ය වේ.)

(i) K ආ.වි. 35 A ආකෘති පත්‍රය

(ii) උප්පැන්න සහතිකයේ මුල් පිටපත එහි ඡායාස්ථිති පිටපතක් ද සමඟ (ඉංග්‍රීසි පරිවර්තන උප්පැන්න සහතිකයේ මුල් පිටපත ලෙස නොසැලකේ)

(iii) දෙමාපියන්ගේ ගමන් බලපත්‍රවල දත්ත පිටුවල ඡායාස්ථිති පිටපත් සහ ළමුන් ඇතුළත් කරන පිටුවල (පිටු අංක 8, 9) ඡායාස්ථිති පිටපතක් සමඟ ගමන් බලපත්‍රය.

(iv) දෙමාපියන් ගමන් බලපත්‍ර ලබාගෙන නොමැති නම්, ඒ බවට දිවුරුම් ප්‍රකාශයක් හා දෙමාපියන්ගේ ජාතික හැඳුනුම්පත් සමඟ ඒවායේ ඡායාස්ථිති පිටපත්.

(v) දරුවන්ට ගමන් බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ දෙමාපියන්ගේ කැමැත්ත ප්‍රකාශිත ලිපි (මව හෝ පියාගෙන් එක් අයෙක් හෝ දෙදෙනාම හෝ විදේශගතව සිටී නම් ඔවුන්ගේ කැමැත්ත ප්‍රකාශිත ලිපි අදාළ රටේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය/මහ කොමසාරිස් කාර්යාලයෙන් සහතික කර ඉදිරිපත් කළ යුතුය.)

(vi) මව හෝ පියා මියගොස් ඇත්නම්, අදාළ මරණ සහතිකය එහි ඡායාස්ථිති පිටපතක් ද සමඟ

(vii) දෙමාපියන් දික්කසාද නම් දික්කසාද සහතිකයෙහි සහතික පිටපතක් එහි ඡායාස්ථිති පිටපතක්ද සමඟ

(viii) දරුවාට වෙනම ගමන් බලපත්‍රයක් ලබාගැනීමට පෙර, එම දරුවා තම මවගේ හෝ පියාගේ වලංගු ගමන් බලපත්‍රයට ඇතුළත් කර තිබේ නම් එය ප්‍රථමයෙන් ඉවත් කළ යුතු අතර ඒ සඳහා (ආ.වි. 35 'C') පෝරමය පුරවා රු. 500.00 ක ගාස්තුවක් සමඟ ඉදිරිපත් කළ යුතුය.

(ix) දරුවන් විදේශයක උපත ලබා සිටී නම් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ශ්‍රී ලංකාවේ පුරවැසි සහතිකය එහි ඡායාස්ථිති පිටපතක් ද සමඟ ඉදිරිපත් කළ යුතුය.

(x) අයදුම් පත්‍රය භාරදීම සඳහා දෙමාපියන් දෙදෙනාම පැමිණිය යුතුය.

**(ඈ) ගමන් බලපත්‍ර ලබාගැනීමේදී පහත සඳහන් වැරදි කිරීම් 1955 අංක 16, 1961 අංක 68, 1993 අංක 16, 1998 අංක 42, 2006 අංක 31 සහ 2015 අංක 07 දරන පනත්වලින් සංශෝධිත 1948 අංක 20 දරන පනතට අනුව දඬුවම් ලැබිය හැකි වැරදි අතරට ගැනේ:**

(i) අසත්‍ය තොරතුරු සැපයීම.

(ii) කූට ලෙස තැනූ හෝ ව්‍යාජ ලේඛන ඉදිරිපත් කිරීම.

(iii) වලංගු ගමන් බලපත්‍රයක් ළඟ තබාගෙන, තවත් ගමන් බලපත්‍රයක් ඉල්ලුම් කිරීම.

(iv) වෙනත් අයගේ ගමන් බලපත්‍ර පරිහරණය කිරීම.

(v) ලබාගත් ගමන් බලපත් ව්‍යාජ ලෙස වෙනස් කිරීම.

(vi) වෙනත් අයගේ ලේඛන ඉදිරිපත් කොට, ගමන් බලපත්‍ර ලබාගැනීම.

**(ඉ) ගමන් බලපත්‍රයක් නැතිවූ අවස්ථාවක පහත සඳහන් දෑ ඉදිරිපත් කළ යුතුය.**

(i) ගමන් බලපත්‍රය නැතිවූ බවට පොලිසියේ කරන ලද පැමිණිල්ලේ මුල් පිටපත.

(ii) ගමන් බලපත්‍රය පිටරටකදී නැතිවූයේ නම්, එම රටේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මඟින් ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා නිකුත් කල (NMRP) තාවකාලික ගමන් ලියවිල්ල (ඡායාස්ථිති පිටපතක් ද සමඟ)

(iii) ගමන් බලපත්‍ර ගාස්තුවට අමතරව, රු. 10,000.00 ක (රුපියල් දස දහසක) දඩ මුදලක් (මෙම දඩ මුදල අයකරනු ලබන්නේ නැතිවූ ගමන් බලපත්‍රයේ වසර දහයක වලංගු කාලය ඉක්මවා නොමැති නම් පමණි.)

**(ඊ) ගාස්තු:**

| | | එක්දින සේවය | සාමාන්‍ය සේවය | වයස අවු. 16 ට අඩු ළමුන් සඳහා වසර 3 ක කාලයකට: එක්දින සේවය | වයස අවු. 16 ට අඩු ළමුන් සඳහා වසර 3 ක කාලයකට: සාමාන්‍ය සේවය |
|---|---|---|---|---|---|
| (i) | සියලුම රටවල් සඳහා ගමන් බලපත්‍රය | රු. 10,000.00 | රු. 3,000.00 | රු. 5,000.00 | රු. 2,000.00 |
| (ii) | මැදපෙරදිග ඇතුළු නිශ්චිත රටවල් සඳහා ගමන් බලපත්‍රය | රු. 2,500.00 | රු. 1,000.00 | රු. 1,500.00 | රු. 1,000.00 |
| (iii) | ඉන්දියාව සහ නේපාලය සඳහා හදිසි සහතිකය | — | රු. 500.00 | — | — |
| (iv) | සියලු රටවල් සඳහා හදිසි සහතිකය | රු. 3,000.00 | — | — | — |
| (ශ්‍රී ලංකා රජයේ තීරණ මත සියලුම ගාස්තු සංශෝධනය විය හැක) | | | | | |

**(උ) භික්ෂූන් වහන්සේලා සඳහා ගමන් බලපත්‍ර ඉල්ලුම් කිරීම:**

(i) උප්පැන්න සහතිකයේ මුල් පිටපත සහ ජාතික හැඳුනුම්පත ඡායාස්ථිති පිටපත් සමඟ ඉදිරිපත් කළ යුතුය.

(ii) භික්ෂු සාමණේර සහතිකය හෝ උපසම්පදා සහතිකය ඡායාස්ථිති පිටපත් සමඟ ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

**(ඌ) *අයදුම්පත් භාර ගැනීම (රජයේ වැඩකරන දිනවල)**

| | | |
|---|---|---|
| එක්දින සේවය | පෙ.ව. 8.30 | ප.ව. 1.30 දක්වා |
| සාමාන්‍ය සේවය | පෙ.ව. 8.30 | ප.ව. 1.30 දක්වා |

කොළඹ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මොබිටෙල් විශේෂ ශාඛාව වෙත පැමිණෙන්න.
கொழும்பு குடிவரவு, குடியகல்வுத் திணைக்களத்திலுள்ள எமது மொபிடெலின் விசேட கிளைக்கு விஜயஞ் செய்யுங்கள்.
Visit us at the Mobitel Special Branch, Department of Immigration & Emigration, Colombo.

මෙම ඉල්ලුම් පත්‍රය නොමිලේ නිකුත් කෙරේ/ இவ்விண்ணப்பப் பத்திரம் இலவசமாக விநியோகிக்கப்படும் / THIS APPLICATION IS ISSUED FREE OF CHARGE

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
குடிவரவு, குடியகல்வுத் திணைக்களம்
**DEPARTMENT OF IMMIGRATION AND EMIGRATION**

විදේශයකදී ශ්‍රී ලාංකේය අනන්‍යතාව
வெளிநாட்டில் இலங்கையரின் அடையாளம்
**SRI LANKAN IDENTITY OVERSEAS**

SRI LANKA IMMIGRATION AND EMIGRATION

ආකෘතිය / படிவம் / Form } K

ආ. වි. / கு. கு. / I. E. } 35 A

# ශ්‍රී ලංකා ගමන් බලපත්‍රයක්, හදිසි/හඳුනාගැනීමේ සහතිකයක් සඳහා ඉල්ලුම්පත්‍රය
# இலங்கை கடவுச்சீட்டு, அவசர/அடையாளச் சான்றிதழ் விண்ணப்பம்
# APPLICATION FOR A SRI LANKAN PASSPORT, EMERGENCY/ IDENTITY CERTIFICATE

පරිගණකයට දත්ත සහ තොරතුරු ඇතුළත් කළ හැක්කේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් බැවින් **අයදුම්පත ඉංග්‍රීසියෙන් පමණක් පිරවිය යුතුය.** වැඩි විස්තර සඳහා උපදෙස් පත්‍රිකාව බලන්න.
கணனியானது ஆங்கில மொழியை மட்டுமே ஏற்றுக்கொள்வதால் **விண்ணப்ப படிவத்தை ஆங்கிலத்தில் மட்டுமே பூர்த்திசெய்தல் வேண்டும்** மேலதிக தகவல்களுக்கு அறிவுறுத்தல் படிவத்தைப் பார்க்கவும்.
The data and information are fed into the computer in English. Hence **the application must be filled in English.** Please read the instruction sheet for further information.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා/ அலுவலக உபயோகத்திற்கு மாத்திரம்/ For Official use only

| APPLICATION NO. | ALLOCATED PASSPORT NO. | AC CODE |
|---|---|---|
| N | | |

1. Type of Service } Normal ☐ One Day ☐
2. Type of Travel Document } All Countries ☐ Middle East Countries ☐ Emergency Certificate ☐ Identity Certificate ☐
3. Present Travel Document No. (If any) ☐☐☐☐☐☐☐☐☐☐
4. NMRP No. (If any) ☐☐☐☐☐☐☐☐☐☐
5. National Identity Card No. } ☐☐☐☐☐☐☐☐☐☐☐☐
6. Surname }
7. Other Names }
8. Permanent Address }

    8.1 District

9. Date of Birth } Date ☐☐ Month ☐☐ Year ☐☐☐☐
10. Birth Certificate } No. ☐☐☐☐ District
11. Place of Birth }
12. Sex } Female ☐ Male ☐
13. Profession/ Occupation/ Job }
14. Have you obtained Dual Citizenship in Sri Lanka? } Yes ☐ No ☐

    If Yes, Dual Citizenship No.

    (Please fill up fields 17 and 18 in the next page)

15. Mobile/ Phone No. (to be notified via SMS when passport is ready for collection) }
16. E-mail Address }

මොබිටෙල් වෙතින් අඩුම රෝමිං ගාස්තු
மொபிடெல் மூலம் ஆகக் குறைந்த ரோமிங் கட்டணங்களை அனுபவித்திடுங்கள்
Enjoy the best rates from Mobitel while you roam across the world
අමතන්න/அழையுங்கள்/Call : 1717
Sri Lanka Telecom Mobitel We Care. Always.

## Compulsory for Dual Citizenship Holders

| | |
|---|---|
| 17. Foreign Nationality | |
| 18. Foreign Passport No. | |

**19. If this application is for a child below the age of 16 years, following information must also be provided.**

| Father / Guardian<br>National Identity Card No. / Present Travel Document No. | Mother / Guardian<br>National Identity Card No. / Present Travel Document No. |
|---|---|
| | |

20. අයදුම්කරු විසින් පහත දැක්වෙන කොටු දෙක තුළ කළු ඉරිවල නොගෑවෙන පරිදි අත්සන වෙන වෙනම තැබිය යුතුය.
கீழே உள்ள இரண்டு கூடுகளுக்குள்ளும் தயவு செய்து உங்கள் கையொப்பத்தை இடவும், கையொப்பம் கூடுகளில் முட்டக் கூடாது.
Applicant, Please place your signature inside both cages below. Signature should not touch the border.

| | |
|---|---|
| | |

21. අයදුම්කරුගේ ප්‍රකාශය/விண்ணப்பதாரரின் உறுதியுரை / Declaration of the Applicant

මම ශ්‍රී ලාංකික පුරවැසියෙකු බවත් මා විසින් ඉහත සඳහන් කළ තොරතුරු හා මේ අයදුම්පතට අමුණා ඇති අනෙකුත් ලේඛන සත්‍ය හා නිවැරදි බවට ප්‍රකාශ කරමි. තවද, අසත්‍ය තොරතුරු සහ ලියකියවිලි ඉදිරිපත් කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් බව දනිමි.

நான் ஒரு இலங்கைப் பிரஜையெனவும், மேற்படி என்னால் வழங்கப்பட்டுள்ள தகவல்களும் இணைக்கப்பட்டுள்ள ஆவணங்களும் சரியானவையெனவும், உண்மையானவையெனவும் இத்தால் உறுதியுரைக்கின்றேன். தவறான / போலியான ஆவணங்களைச் சமர்ப்பிப்பது தண்டனைக்குரிய குற்றமாகுமென்பதையும் நான் அறிவேன்.

I declare that I am a citizen of Sri Lanka and the above information provided by me and the documents attached hereto are true and correct. Also, I am aware of the fact that producing forged/falsified documents and information is a punishable offence.

.................................................... ............................................................................................

දිනය/திகதி /Date

අයදුම්කරුගේ අත්සන/விண்ணப்பதாரியின் கையொப்பம்
Signature of the Applicant

<table>
<tr><th colspan="3">කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා/அலுவலக உபயோகத்திற்கு மாத்திரம்/For Official use only</th></tr>
<tr><td rowspan="2">Controller's Order</td><td>Minute Sheet Attached (If any)<br><br>..............................<br>DC / AC Signature</td><td rowspan="3">PPT No:<br><br>PPT Lost: Yes/No<br><br>Police Report / TTD / NMRP<br><br>Dual Citizen: Yes / No<br><br>BC No. & District:<br><br>NIC / DL / Postal ID<br><br>MC No. & District<br><br>F's PPT / NIC Copy & Concent Letter<br><br>M's PPT / NIC Copy & Concent Letter<br><br>DC / AC's Order:</td></tr>
<tr><td></td></tr>
<tr><td colspan="2">Pending at Computer Division</td></tr>
</table>

කොළඹ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මොබිටෙල් විශේෂ ශාඛාව වෙත පැමිණෙන්න.
கொழும்பு குடிவரவு, குடியகல்வுத் திணைக்களத்திலுள்ள எமது மொபிடெலின் விசேட கிளைக்கு விஜயஞ் செய்யுங்கள்.
Visit us at the Mobitel Special Branch, Department of Immigration & Emigration, Colombo.
Sri Lanka Telecom Mobitel We Care. Always.